සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	ගෘහ ආර්ථික විද්‍යාව I - II	කාලය நேரம் Time: පැය 3 මි. 10

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට i , ii , iii , iv පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

01. ධාන්‍යවලට උදාහරණ දෙකකි.

i. කව්පි,කඩල. ii. සහල්, මුං ඇට. iii. පරිප්පු, මෑ. iv. කුරක්කන්, මෙනේරි

02. සැකරයිඩ අණු දෙකක් එකතුවී සෑදෙන කාබොහයිඩ්‍රේටයකි,

i. මොනොසැකරයිඩ. ii. ඩයිසැකරයිඩ. iii. සෙලියුලෝස්. iv. පොලිසැකරයිඩ.

03. ප්‍රෝටීන්වල කෘත්‍යයන් කිහිපයකි.

i. ශක්තිය නිපදවීම, කේශ වර්ධනය, ජල තුලනය
ii. පටක වර්ධනය, හෝර්මෝන නිෂ්පාදනය,එන්සයිම නිෂ්පාදනය
iii. කාටිලේජ, මෙලනින්, ඉන්සියුලින් නිෂ්පාදනය
iv. ස්නායු ක්‍රියාකාරිත්වය, අස්ථි වර්ධනය, රුධිරය නිෂ්පාදනය

04. කිරිවල හා මස්වල අඩංගු ප්‍රෝටීන් කාණ්ඩය නම්,

i. ග්ලූටන් හා සෙයින් ය. ii. මයොසින් හා ලෙගියුමින් ය.
iii. කේසින් හා ඇල්බින් ය. iv. කේසින් හා මයොසින් ය.

05. පළතුරු ඉදෙන විට ඇතිවන අධික පැණි රසට හේතු වන්නේ එහි අඩංගු,

i. මෝල්ටෝස් ය. ii. ලැක්ටෝස් ය. iii. ෆ්රක්ටෝස් ය. iv. පෙක්ටීන් ය.

06. එළවළු හා පළතුරුවල බහුලව අඩංගු ප්‍රතිඔක්සිකාරකයන් දෙකකි.

i. විටමින් A හා C ii. විටමින් C හා K iii. විටමින් C හා B iv. විටමින් E හා K

07. ජල ද්‍රාව්‍ය විටමිනයකි.

i. රෙටිනෝල් ii. ටොකොෆෙරෝල් iii. රයිබොෆ්ලේවින් iv. කොලි කැල්සිෆෙරෝල්

08. කැල්සියම් බහුල ආහාර කාණ්ඩය වන්නේ,

i. කුඩා මාළු, බිත්තර කහමද, පලා වර්ග. ii. කිරි හා කිරි නිෂ්පාදන, පලා වර්ග, කුරක්කන්.
iii. කුඩා මාළු, රටකජු, කැරට්. iv. පීකුදු, කුඩා මාළු, වට්ටක්කා.

09. පහත ප්‍රකාශවලින් සාවද්‍ය ප්‍රකාශය නම්,

i. විටමින් A,D,E හා K මේද ද්‍රාව්‍ය විටමින් ය.
ii. ලිනොලෙනික් හා ලිනොලෙයික් අම්ල අත්‍යවශ්‍ය මේද අම්ල වේ.
iii. පෙක්ටීන්, ග්ලයිකොජන් පොලිසැකරයිඩ වේ.
iv. යකඩ හා අයඩීන් මහා ඛනිජ වේ.

Past Papers Wiki

10. නොපිසූ ආහාර ද්‍රව්‍ය ග්‍රෑම් 100ක අඩංගු පෝෂණ ප්‍රමාණය දැක්වෙන සටහන.

i. ආහාර පිරමීඩයයි.
ii. පෝෂණ වගුවයි.
iii. දෛනික පෝෂණ අවශ්‍යතා සටහනයි.
iv. බොජුන්පතයි.

11. එළවළු හා පලාවර්ග ශීතකරණයේ ගබඩා කළ යුතු උෂ්ණත්වය වන්නේ,

i. 4^0C- 8^0C අතරය.
ii. 7^0C- 10^0C අතරය.
iii. 18^0C ට අඩුය.
iv. 10^0C- 18^0C අතරය.

12. 5mm × 5mm × 5mm හතරැස් කොටු ආකාරයට ආහාර කැපීම,

i. ජූලියන් ක්‍රමයයි
ii. මසඳුවාන් ක්‍රමයයි.
iii. පෙයිසෑන් ක්‍රමයයි.
iv. බෘනුවාස් ක්‍රමයයි.

13. රත් වූ බඳුනේ තෙල් ආලේප කර සකස් කරගත් ආහාරය පිස ගැනීම,

i. නොගැඹුරු තෙලේ බැදීමයි.
ii. තෙල් ස්වල්පයක් දමා බැදීමයි.
iii. තෙල් ආලේපයෙන් පිසීමයි.
iv. ගැඹුරු තෙලේ බැදීමයි.

14. ආහාරයක මෘදු වයනයක් ලබා ගැනීමට වඩාත් සුදුසු ශිල්පීය ක්‍රමයකි.

i. කලවම් කිරීම
ii. ගැසීම
iii. පදම් කිරීම
iv. අත් ගැසීම

15. ආන්ත්‍රික පිළිකා හා මළබද්ධය වැළැක්වීමට උපකාරී වන්නේ,

i. ඔමේගා 3 මේද අම්ලයි.
ii. මාෂබෝග ආහාර යි.
iii. සෙලියුලෝස් ය.
iv. කිරි හා කිරි නිෂ්පාදන ය.

16. මිනිස් සිරුරේ ජල තුලනය හා අම්ල භෂ්ම තුලනය පවත්වා ගැනීමට අවශ්‍ය බනිජ ලවණ දෙකකි.

i. කැල්සියම් සහ යකඩ.
ii. සෝඩියම් සහ පොටෑසියම්.
iii. කැල්සියම් සහ මැග්නීසියම්
iv. යකඩ සහ පොස්පරස්.

17. වැඩි සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයක සිට අඩු සාන්ද්‍රණ මාධයයකට ද්‍රව්‍ය අංශු ගමන් කිරීම,

i. ආස්‍රැතිය යි.
ii. විකිරණය යි.
iii. විච්ඡේදනය යි.
iv. විසරණය යි.

18. හීම් යකඩ සඳහා උදාහරණ වන්නේ,

i. මස් හා මාළු.
ii. ගොටුකොළ හා බිත්තර.
iii. බිත්තර හා කරවල.
iv. මුරුංගා කොළ හා ගොටුකොළ.

19. ආහාර ආකලන යටතේ E 100 යනු,

i. වර්ණකයකි.
ii. පරිරක්ෂණ කාරකයකි.
iii. පිපුම්කාරකයකි.
iv. රසකාරකයකි.

20. ආහාර පදම් කිරීමේ ක්‍රියාවළියට උදාහරණයකි.

i. ගොටුකොළ සම්බල් සහ තෙබු කොළ සම්බල්.
ii. ලුණු කැඳසහ තැම්බුම් හොදි.
iii. මාළු ඇඹුල්තියල් සහ මස් ව්‍යංජන
iv. සුප් සහ කොළ කැඳ.

21. අලංකාරය මෙන්ම ක්‍රියානුරූපී බව ගෙන දෙන උපාංග වන්නේ,

i. බිත්ති සැරසිලි, පාපිස්ස.
ii. ලියුම් රඳවනය, අත්පිස්නා රඳවනය.
iii. පාපිස්ස, මල්පෝච්චි.
iv. බිත්ති සැරසිලි, රුක් කලා නිර්මාණ.

22. මැහුම් උපකරණ, මෙවලම්,ද්‍රව්‍ය පිළිවෙලින් අඩංගු පිළිතුර වන්නේ,

i. මහන යන්ත්‍රය, රෙදි කපන කතුර, රෙදි
ii. මහන යන්ත්‍රය, ස්ත්‍රික්කය, දිදාලය.
iii. දැති රෝදය, එම්බ්‍රොයිඩර් රාමුව, විසිතුරු පබළු.
iv. ස්ත්‍රික්කය,නූල් වර්ග, බොත්තම්.

23. අක් සැරසිලි සඳහා උදාහරණ වන්නේ,

i. ගවුමක ඉනට පටියක් ඇල්ලීම, කමීසයක බොත්තම් ඇල්ලීම.

ii. හැට්ටයකට ඔපනැලි මැසීම, ආර යෙදීම, අත අගටරේන්දයක් ඇල්ලීම.

iii. ගවුමක වාටියට බඳනයක් යෙදීම, අත අගට රේන්දයක් ඇල්ලීම.

iv. ළදරු ගවුමේ පපුවට බූලියන් මැස්ම මැසීම, වාටියට බිලැන්කට් මැස්ම මැසීම.

24. මෙම විසිතුරු මැහුම් ක්‍රමය නම්,

i. ලේසි ඩෙසි මැස්ම. ii. කතිර මැස්ම.

iii. දම්වැල් මැස්ම. iv. බිලැන්කට් මැස්ම.



25. ශාකමය කෙඳි සඳහා උදාහරණ වේ.

i. කපු, ලිනන් ii. සේද, ලෝම iii. ලිනන්, සේද iv. රන්, රිදී.

26. රෙදි පිරියම් කිරීම යනු,

i. රෙදිවල දෝෂ ඉවත් කර, මැසීමට සුදුසු තත්ත්වයට පත් කර ගැනීමයි.

ii. රෙදි පිරිමසා කපා ගැනීමයි.

iii. පතරොම භාවිත කර රෙදි කැපීමයි.

iv. රෙදි සඳහා කැඳ යොදා ස්ත්‍රික්ක කර ගැනීමයි.

27. ළදරු ඇඳුමේ උරහිසට යොදන මූට්ටුව වන්නේ,

i. විවෘතපැනලි මූට්ටුව යි. ii. පැනලි මූට්ටුව යි. iii. ප්‍රංශ මූට්ටුව යි. iv. පිටාර මූට්ටුව

28. ළදරුඇඳුම් මැසීමේ අනුපිළිවෙල වන්නේ,

i. උරහිස, කර, විවරය, අත්කට, වාටිය ii. උරහිස, කර, වාටිය, අත්කට, විවරය

iii. උරහිස, අත්කට, කර, විවරය, වාටිය iv. උරහිස, විවරය, කර, අත්කට, වාටිය

29. ළදරු ඇඳුමේ වාටියට සුදුසු විසිතුරු මැහුම් ක්‍රම දෙකකි.

i. බිලැන්කට් මැස්ම, කතිර මැස්ම. ii. බඳනයක් යෙදීම,ඇඹරුම් වාටිය.

iii. රේන්ද ඇල්ලීම,බීක්කු මැසීම. iv. රැලිපටි යෙදීම,ඉදිකටු රේන්දය.

30. ළදරු ඇඳුමේ විවරය පියවීම සඳහා සුදුසුම ක්‍රමය වන්නේ,

i. සැන ගාන්වු යෙදීම ය. ii. ටේප් ඇල්ලීම ය.

iii. දෙපෙති ජන්තු ඇල්ලීම ය. iv. වෙල්කොටේප් ඇල්ලීමය.

31.භෞතික නොවන සම්පත් ඝනයට අයත් වන්නේ,

i. විදුලිය හා ඉන්ධනයි. ii. කාලය හා විදුලිය යි. iii. මුදල් හා කාලයයි. iv. ශ්‍රමය හා කාලයයි.

32. න්‍යෂ්ටික පවුලක ලක්ෂණයක් නොවන්නේ,

i. තීරණ ගැනීමේ හැකියාව ය. ii. ස්වාධීනත්වය ය. iii. ත්‍යාගශීලීබව ය. iv. පෞද්ගලිකත්වය ය.

33. පවුල තුළින් සපුරාලන අවශ්‍යතා අතර සාමාජීය අවශ්‍යතා පමණක් ඇතුලත් කාණ්ඩය වනුයේ,

i. සෞඛ්‍ය පහසුකම්, සහයෝගය හා පරිත්‍යාගශීලීත්වය ii. පරිත්‍යාගශීලීත්වය, ආහාර පාන, ඇඳුම් පැලඳුම්

iii. සහයෝගය, පරිත්‍යාගශීලීත්වය, කරුණාව iv. රැකවරණ, ආහාර පාන, සහයෝගය


34. පවුලක පැවතුම් කාලය ප්‍රධාන කොටස්,

i. 3 කි. ii. 4 කි. iii. 6 කි. iv. 5 කි.

35. ගෘහීය සම්පත් අතර ප්‍රජා පහසුකම් පමණක් අඩංගු කාණ්ඩය වනුයේ,

i. ක්‍රීඩා පිට්ටනි හා මුදල්. ii. පුස්තකාලය හා දැනුම.
iii. පුස්තකාලය හා ප්‍රවාහන සේවය. iv. දේශපාලන හා ආකල්ප.

36. පහත දැක්වෙන්නේ නිවාස සැලසුම් ඇඳීමේ දී භාවිත වන සංකේත දෙකකි.



මෙම සංකේත දෙක පිළිවෙලින්,

i. දොර හා ජනේලය ii. ජනේලය හා ෆෑන් ලයිට්
iii. බිත්තිය හා ජනේලය iv. දෙපියන් දොර හා ජනේලය

37. පාරභාෂක වීදුරු යොදා ගන්නේ,

i. විසිත්ත කාමරය සඳහා යි. ii. මුළුතැන්ගෙය සඳහා යි.
iii. නිදන කාමරය සඳහා යි. iv. කෑම කාමරය සඳහා යි.

38. නිවස සංවිධානය කිරීමේ දී භාවිතවන බහුකාර්ය ගෘහභාණ්ඩයක් හා ඉඩකඩ පිරිමසින ගෘහභාණ්ඩයක් පිළිවෙලින් සඳහන්ව ඇත්තේ,

i. ඩිවානය, ලාච්චු සහිත ඇඳ ii. ඩිවානය, තට්ටු ඇඳන්
iii. හකුලන ඇඳ, තට්ටු ඇඳ iv. බිත්ති අල්මාරිය, තට්ටු ඇඳ

39. නිවස සංවිධානයේ දී නිවස සඳහා අලංකාර කිරීමට භාවිතවන උපාංගයක් වනුයේ,

i. කණ්ණාඩි මේසය ii. ලාච්චු සහිත ඇඳන් iii. හකුලන මේසය iv. බුමුතුරුණු

40. කාමරයක වර්ග ප්‍රමාණයෙන් දොර සඳහා වෙන් කළ යුතු ඉඩ ප්‍රමාණය වන්නේ,

i. $\frac{1}{4}$ කි. ii. $\frac{1}{18}$ කි. iii. $\frac{1}{15}$ කි. iv. $\frac{1}{10}$ කි.

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

ගෘහ ආර්ථික විද්‍යාව II

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මාලා සරත් සමග විවාහ වී කෙටි කාලයකි. ඔවුන් දැනට සරත් ගේ නිවසේ දෙමාපියන් සමග ජීවත් වේ. නව නිවසක් ඉදිකිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. රජයේ රැකියාවක් නොකරන මාලා ස්වයං රැකියාවක් ලෙස ඇඳුම් මැසීම හා අලංකාර උපාංග නිර්මාණය කරයි.

i. මෙම යුවල ජීවත්වන පවුල කුමන පවුල් ප්‍රභේදයකට අයත් වේද?

ii. එම පවුල් ප්‍රභේදයේ වාසි දෙකක් ලියන්න.

iii. ඔවුන් ඉදිකිරීමට යෝජිත නිවස සඳහා භූමිය තෝරා ගැනීමේ දී සැළකිලිමත් වූ කරුණු 2ක් ලියන්න.

iv. නිවාස සැලසුම් ඇඳීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 2ක් සඳහන් කරන්න.

v. මෙම පවුලේ ආහාර වේල සඳහා එකතු කර ගත හැකි මාශ බෝග දෙකක් නම් කරන්න.

vi. මෙම පවුල ආහාර වේල සැලසුම් කිරීමේ දී ආහාර පිරමීඩය උපයෝගී කර ගනී.පිරමීඩයට අනුව අඩුවෙන්ම ගත යුතු ආහාර දෙක නම් කරන්න.

vii. මෙම පවුලේ අය කාබොහයිඩ්‍රේට් අඩංගු ආහාර වැඩිපුර ගැනීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල දෙකක් ලියන්න.

viii. ඔවුන්ගේ ප්‍රධාන ආහාරවේලට එකතු කරන මස් හා මාළුවල පොදුවේ අඩංගු වන ප්‍රෝටීන් වර්ග දෙක නම් කරන්න.

ix. මාලා ස්වයං රැකියාවක් ලෙස කරන ඇඳුම් මැසීමේ දී භාවිත කරන මූලික මැහුම් ක්‍රම දෙකක් සඳහන් කරන්න.

x. ස්වයං රැකියාවක් ලෙස උපාංග නිර්මාණය කිරීමෙන් මාලාට සැපයෙන වාසි දෙකක් ලියන්න. (ල.2×10=20)

02. i. ළදරු ඇඳුමක් සඳහා රෙදි තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු 3ක් ලියන්න. ල. 03

ii. ළදරු ඇඳුමක නිබිය යුතු ලක්ෂණ 3ක් ලියන්න. ල. 03

iii. විකර්ණාකාර පටියක් මූවිටු කරන ආකාරය රූපසටහන් ඇසුරින් පැහැදිලි කරන්න. ල. 04

03. i. ක්විල්ට් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය නම් කරන්න. ල. 03

ii. ක්විල්ට් කිරීමට අවශ්‍ය මැහුම් ක්‍රම 3ක් ලියන්න. ල. 03

iii. ලිපි රඳවනය මැසීමේ දී සාක්කු අලංකාර කිරීමට සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න. භාවිත කළ විසිතුරු මැහුම්ක්‍රම සඳහන් කරන්න. ල. 04

04. i. ආහාර හා පෝෂණය මගින් සිරුරට ඉටු කරන කාර්යයන් 03ක් නම් කරන්න. ල. 03

ii. පහත දැක්වෙන ආහාරවලට ආවේණික වර්ණක හඳුන්වන්න.

- ගොටු කොළ/නිවිති
- වට්ටක්කා/කැරට්
- දන්දිල/බීට්රූට්

ල. 03

iii. ආහාරයක ගුණාත්මක බව තීරණය කරන ලක්ෂණ මොනවාද? ල. 04

05. i. ආහාර පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ශිල්පීය ක්‍රම 3ක් ලියන්න. ල. 03

ii. ආහාර පිසීමේ ප්‍රධාන ක්‍රම 03 නම් කරන්න. ල. 03

iii. පහත කරුණු කෙටියෙන් හඳුන්වන්න.

(1) ෆෝලික් අම්ලය (2) සගන්ධය (3) යීස්ට් (4) මහා පෝෂක ල. 04

06. i. විස්තෘත පවුල හඳුන්වන තවත් නම් 3ක් ලියන්න. ල. 03

ii. විස්තෘත පවුලකින් සැලසෙන වාසි 3ක් සඳහන් කරන්න. ල. 03

iii. පවුල තුළින් සැපයෙන මානසික අවශ්‍යතා 2ක් හා කායික අවශ්‍යතා 2ක් වෙන් වෙන්ව ලියන්න. ල. 04

07. i. නිවසක් ඉදිකිරීම සඳහා භූමිය තෝරා ගැනීමේ දී සැපයෙන යටිතල පහසුකම් 3ක් ලියන්න. ල. 03

ii. නිවාස සැලසුම් ඇඳීමේ දී අවධානය යොමු විය යුතු කරුණු 3ක් ලියන්න. ල. 03

iii. (අ) හරස් සංවාතනය යනු කුමක්ද? ල. 02

(ආ) නිවෙස තුළට ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය මැනවින් ලබා දීමෙන් සැලසෙන වාසි 2ක් ලියන්න. ල. 02

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank